සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 25 | S | I |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

## Second Term Test - Grade 13 - 2018

විභාග අංකය .............................  ලංකා ඉතිහාසය I  කාලය පැය එකයි.

උපදෙස්

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

**1 කොටස**

- **අංක 01 සිට 05 තෙක් වූ ප්‍රශ්න වලට එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දක්වා ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය තිත් ඉර මත ලියන්න.**

01. 1. දැදිගම 2. රයිගම 3. සීතාවක
    4. දඹදෙණිය 5. පඬුවස්නුවර (.....)

02. 1. ගල්විහාර ලිපිය 2. වේවැල්කැටිය ලිපිය 3. අඹගමුව ලිපිය
    4. දෙවනගල ලිපිය 5. බෝපිටිය ලිපිය (.....)

03. 1. ගෝඨාභය 2. මහා නාම 3. යටාලතිස්ස
    4. කාවන්තිස්ස 5. ජෙට්ඨතිස්ස (.....)

04. 1. ලොරෙන්සෝද අල්මේදා 2. දොන් ජෙරනිමෝද අසවේදු
    3. ජේරෝ ලෝපේස් ද සූනා 4. කොන්ස්තන්තීනුද සා
    5. දියෝගු ද මේලෝ (.....)

05. 1. ධර්ම පරාක්‍රමබාහු 2. සකල කලා වල්ලභ කුමරු 3. චක්‍රායුධ කුමරු
    4. තනිය වල්ලභ කුමරු 5. වේධය කුමරු (.....)

- **අංක 06 සිට 10 තෙක් ප්‍රශ්න වල පද යුගල පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

06.
1. සිංහල බෝධි වංශය - විල්ගම්මුල ශ්‍රී පරාක්‍රමබාහු හිමි
2. කාව්‍යශේඛරය - තොටගමුවේ රාහුල හිමි
3. සද්ධර්ම රත්නාකරය - ධර්මසේන හිමි
4. රසවාහිනිය - වේදේහ හිමි
5. නිකාය සංග්‍රහය - ජයබාහු දේවරක්ඛිත හිමි (.....)

07.
1. අලකපය මහරජ - කාශ්‍යප රජතුමා
2. නරඉසෙර - වසභ රජතුමා
3. කාලිංග චක්‍රවර්ති - නිශ්ශංක මල්ල රජතුමා
4. මපුරුම් බුදදස් ළපරිදේව - බුද්ධ පාරින්ද රජතුමා
5. බෝසත් විජයබාහු - IV විජයබාහු රජතුමා (.....)

08.
1. පළමුවන විජයබාහු රජතුමා - තිලෝක සුන්දරී
2. කාවන්තිස්ස රජතුමා - අභිසවෙහෙර
3. පළමුවන පැරකුම් රජතුමා - සුන්දර මහාදේවී
4. මණාභරණ රජතුමා - මහා රත්නාවලී දේවී
5. සෙනරත් රජතුමා - කුසුමාසන දේවී (.....)

09.
1. කදුරුගොඩ විහාරය - යාපනය
2. හිරිහඩුසෑය - ත්‍රිකුණාමලය
3. කළුදියපොකුණ - අනුරාධපුරය
4. උත්තරාරාමය - පොළොන්නරුව
5. ස්වර්ණගිරි ගුහා - මාගම (.....)

10.
1. දේවානම්පියතිස්ස රජු - සඝමිත් තෙරණිය
2. සිරිමේඝවණ්ණ රජු - හේමමාලා කුමරිය
3. බුද්ධදාස රජු - බුද්ධඝෝෂ හිමි
4. මහාසේන රජු - සංඝමිත්‍ර භික්ෂුව
5. මහානාම රජු - ෆාහියන් හිමි (.....)

- **අංක 11 - 15 තෙක් වූ ප්‍රශ්නය සඳහා x හා y තීරුවල නාම/ප්‍රකාශන/දින වකවානු දී ඇත. y තීරුවේ දී ඇති නාම/ප්‍රකාශන දින වකවානු x තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. x තීරුව y තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස්කළ විට පහත දී ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. එම නිවැරදි සංයෝගයට හිමි අංකය තෝරා වරහන තුළ යොදන්න.**

11.

| X | | Y |
|---|---|---|
| 1. ජජ්ජර නදී | A | මහානාමමත්ථකවාපී |
| 2. කදම්භ නදී | B | තිස්සවඩ්ඪමානක වාපී |
| 3. යාන් ඔය | C | පානික්කුලම් වැව |
| 4. ගෝන නදී | D | පණ්ඩවාපී |
| 5. මහාවාලුකා නදී | E | චල්ලුරවාපී |

1. DAEC 2. ADEC 3. ECAD
4. EADC 5. ADCE (.....)

12..

| X | | Y |
|---|---|---|
| 1. දේවානම්පියතිස්ස රාජ්‍ය සමය | A | ධම්මධාතුව වැඩම කරවීම |
| 2. ගජබාහු රාජ්‍යසමය | B | බුදුන් වහන්සේගේ දන්ත ධාතූන් වහන්සේ වැඩමකිරීම |
| 3. සිරි මේඝවර්ණ රාජ්‍ය සමය | C | බුදුන් වහන්සේගේ අකු ධාතූන් වහන්සේ වැඩම කිරීම |
| 4. සිලාකාල රාජ්‍ය සමය | D | පත්තිනි සළඹ වැඩම කිරීම |
| 5. කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමය | E | සියම් නිකාය පිහිටුවීම |

1. CDABE 2. DCBAE 3. CDBAE
4. AEBDC 5. BACDE (.....)

13.

| X | | Y |
|---|---|---|
| 1. ජෝන් ඩොයිලි | A | සිංහලේ ආණ්ඩුක්‍රමය පිළිබඳ ලුහුඩු සටහන් |
| 2. එච්.සී.පී. බෙල් | B | කෑගල්ල වාර්තාව |
| 3. තෝමස් ස්කිනර් | C | ලංකාවේ පනස් වසක් |
| 4. ක්වේරෝෂ් | D | හියුං සාන් |
| 5. භ්‍රමණ වෘතාන්තය | E | ලංකාධිපත්‍යය |

1. ABCDE 2. ABDCE 3. ACBED
4. BCAED 5. ABCED (.....)

14.

| X | | Y |
|---|---|---|
| 1. පෘතුගීසි පෙරදිග පාලනයේ ප්‍රධානියා | A | විදෝරේ ද පැසෙන්ඩා |
| 2. ලංකාවේ පෘතුගීසීන්ට අයත් ප්‍රදේශ පාලනය | B | කපිතාන් ජනරාල් |
| 3. ආණ්ඩුවේ ආදායම් භාර නිළධාරියා | C | කැප්ටන් මේජර් |
| 4. යුධ පාලන කටයුතු | D | ඔවිඩෝර් |
| 5. අධිකරණ කටයුතු භාර නිලධාරියා | E | විසුරේ |

1. EBCAD 2. BECDA 3. EBCAD
4. EBACD 5. ABCED (.....)

15. X / Y

| | X | | Y |
|---|---|---|---|
| 1. | ලෝපෝසෙරෝ ද අල්බර්ගේරියාගේ ලංකාගමනය | A | අනුරාධපුරය |
| 2. | මාෂල් ද බොක්කෝවරිගේ ආගමනය | B | යාපහුව |
| 3. | ජාවක චන්ද්‍රභානුගේ ආක්‍රමණය | C | රයිගම |
| 4. | චෙං හෝ සෙනෙවියාගේ ආක්‍රමණය | D | කෝට්ටේ |
| 5. | ෆාහියං හිමිගේ ලංකා සංචාරය | E | මහනුවර |

1. EDBCA
2. DECBA
3. DEBCA
4. ABCED
5. BACDE

(.....)

- **අංක 16 - 20 තෙක් වූ ප්‍රශ්න වලට ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.**

16. විවිධ කාලවලදී ශ්‍රී ලංකාවේ පාලකයින් විසින්කරවන ලද බෞද්ධ ආරාම කාලානුපිළිවෙල අනුව ගැළපූ විට නිවැරදි පිළිවෙල දක්නට ලැබෙන්නේ,
    1. තිස්සාරාමය, සේරුවාවිල මංගල මහාසෑය, මිරිසවැටිය, අභයගිරිය, ජේවතනය
    2. තිස්සාරාමය, සේරුවාවිල මංගල මහා සෑය, මිරිසවැටිය, අභයගිරිය, ජේවතනය
    3. සේවරුවාවිල මංගල මහා සෑය, තිස්සාරාමය, මිරිසවැටිය, අභයගිරිය, ජේතවනය
    4. සේරුවාවිල මංගල මහා සෑය, තිස්සාරාමය, මිරිසවැටිය, ජේතවනය, අභයගිරිය
    5. තිස්සාරාමය, මිරිසවැටිය, සේරුවාවිල මංගල මහා සෑය, අභයගිරිය, ජේතවනය. (.....)

17. කෝට්ටේ රාජධානියේ පාලනය මෙහෙයවූ පාලකයින්ගේ නිවැරදි අනුපිළිවෙල වන්නේ,
    1. VI බුවනෙකබාහු, VIII වීර පරාක්‍රමබාහු, VII පණ්ඩිත පරාක්‍රමබාහු, VI විජයබාහු, VII බුවනෙකබාහු
    2. VII පණ්ඩිත පරාක්‍රමබාහු, VI බුවනෙකබාහු, VIII වීර පරාක්‍රමබාහු, VI විජයබාහු, VII බුවනෙකබාහු
    3. VI විජයබාහු, VI බුවනෙකබාහු, VII පණ්ඩිත පරාක්‍රමබාහු, VIII වීර පරාක්‍රමබාහු, VII බුවනෙකබාහු
    4. VI බුවනෙකබාහු, VII පණ්ඩිත පරාක්‍රමබාහු, VIII වීර පරාක්‍රමබාහු, VI විජයබාහු, VII බුවනෙකබාහු
    5. VI බුවනෙකබාහු, VII බුවනෙකබාහු, VII පණ්ඩිත පරාක්‍රමබාහු, VIII වීරපරාක්‍රමබාහු, VI විජයබාහු (.....)

18. ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ පාලනය කළ ලන්දේසි ආණ්ඩුකාරවරුන්ගේ නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.
    1. ජාන් තයිසන්, විලම් ජේ කොස්ටර්, ජෝන් මාත්සුයිකර්, ජෙකබ් වැන් කීටනස්ටයින්, අද්‍රියන් වැන්ඩර් මෙයිඩන්
    2. විලම් ජේ කොස්ටර්, ජාන් කයිසන්, ජෝන් මාත්සුයිකර්, ජෙකබ් වැන් කීටනස්ටයින්, අද්‍රියන් වැන්ඩර් මෙයිඩන්
    3. ජාන් තයිසන්, ජෝන් මාත්සුයිකර්, විලම් ජේ කොස්ටර්, ජෙකබ් වැන් කීටනස්ටයින්, අද්‍රියන් වැන්ඩර් මෙයිඩින්
    4. විලම් ජේ කොස්ටර්, ජාන් තයිසන්, ජෝන් මාත්සුයිකර්, අද්‍රියන් වැන්ඩර් මෙයිඩන්, ජෙකබ් වැන් කීටනස්ටයින්
    5. ජාන් තයිසන්, විලම් ජේ කොස්ටර්, ජෝන් මාත්සුයිකර්, අද්‍රියන් වැන්ඩර් මෙයිඩන්, ජෙකබ් වැන් කීටනස්ටයින් (.....)

19. පහත සඳහන් ඓතිහාසික සිදුවීම් නිවැරදි අනුපිළිවෙළට ගැළපූ විට ලැබෙන පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.
   1. සීතාවක රාජසිංහ රජු උඩරට අල්ලාගැනීම, දර්මපාල කුමරු බෞතීස්ම ලැබීම, කොනප්පු බණ්ඩාර උඩරට රජවීම, පෘතුගීසීන් ත්‍රිකුණාමල වරාය අල්ලාගැනීම, ගන්නෝරුව සටන
   2. කොනප්පු බණ්ඩාර උඩරට රජවීම, ධර්මපාල කුමරු බෞතීස්ම ලැබීම, සීතාවක රාජසිංහ රජු උඩරට අල්ලා ගැනීම, පෘතුගීසීන් ත්‍රිකුණාමල වරාය අල්ලා ගැනීම, ගන්නෝරුව සටන.
   3. ධර්මපාල කුමරු බෞතීස්ම ලැබීම, සීතාවක රාජසිංහ රජු උඩරට අල්ලා ගැනීම, කොනප්පු බණ්ඩාරඋඩරට රජවීම, ගන්නෝරුව සටන.
   4. ධර්මපාල කුමරු බෞතීස්ම ලැබීම, සීතාවක රාජසිංහ රජු උඩරට අල්ලාගැනීම, කොනප්පු බණ්ඩාර උඩරට රජවීම, ගන්නෝරුව සටන, පෘතුගීසීන් ත්‍රිකුණාමලය වරාය අල්ලා ගැනීම.
   5. සීතාවක රාජසිංහ රජු උඩරට අල්ලා ගැනීම, ධර්මපාල කුමරු බෞතීස්ම ලැබීම, කොනප්පු බණ්ඩාර උඩරට රජවීම, ගන්නෝරුව සටන, පෘතුගීසීන් ත්‍රිකුණාමලය වරාය අල්ලා ගැනීම. (.....)

20. විවිධ අවස්ථාවලදී රජවරුන්ගේ කාර්යන්ට සහයෝගය ලබාදුන් සේනාපතිවරුන්ගේ අනුපිළිවෙළ දැක්වෙන වරණය තෝරන්න.
   1. කපිසීස, වුස්සදේව, මිගාර, නීලමහයෝධයා, මේඝවර්ණාභය
   2. නීලමහා යෝධයා, වුස්සදේව, කපිසීස, මිගාර, මේඝවර්ණාභය
   3. වුස්සදේව, මේඝවර්ණාභය, කපිසීස, මිගාර, නීලමහායෝධයා
   4. මේඝවර්ණාභය, වුස්සදේව, මිගාර, නීලමහායෝධයා, කපිසීස
   5. වුස්සදේව, කපිසීස, නීලමහායෝධයා, මේඝවර්ණාභය, මිගාර (.....)

- **අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

21. ශ්‍රී ලංකාව ඉන්දියාවට ආසන්නයේ පිහිටීම නිසා ඇතිවූ බලපෑම්
   1. ඉන්දියානු ජන කණ්ඩායම් පැමිණීම හා ජනාවාස පිහිටුවීම.
   2. වරින්වර ඉන්දීය ආක්‍රමණ එල්ල වීම.
   3. මෞර්ය අභිෂේක ක්‍රමය දායාද වීම.
   4. ඉන්දියාවෙන් යුධ ආධාර ලබාගැනීම.
   5. ශ්‍රී ලංකාවට අනන්‍ය වූ සංස්කෘතියක් දායාද වීම. (.....)

22. දීපවංසය,
   1. ලංකාවේ දැනට ඉතිරිව ඇති පැරණිතම වංසකතාවයි.
   2. එහි පරිච්ඡේද 22ක් හා ගාථා 1350 ක් අන්තර්ගත වේ.
   3. බුද්ධ කාලයේ පටන් අනුරාධපුර රාජධානියේ අවසානය දක්වා තොරතුරු අන්තර්ගත වේ.
   4. ක්‍රි.ව. 4 - 5 සියවස්වල දී රචනාකර ඇත.
   5. ශ්‍රී ලංකාවේ භික්ෂුණී ශාසනය පිහිටුවීම පිළිබඳ බොහෝ තොරතුරු අන්තර්ගතය. (.....)

23. ප්‍රාග් ඓතිහාසික යුගයේ තාක්ෂණය,
   1. මේ යුගයේ තාක්ෂණය මුළුමනින්ම පාහේ ශිලා මෙවලම් මත ගොඩනැගී ඇත.
   2. පුරා ශිලා යුගයේදී විශාල ප්‍රමාණයේ රළු ශිලා මෙවලම් භාවිතකර ඇත.
   3. මධ්‍ය ශිලා යුගයේදී නිපදවාගත් ශිලා මෙවලම් ජ්‍යාමිතික ක්ෂුද්‍රශිලා මෙවලම් ලෙස හැඳින්වේ.
   4. ජ්‍යාමිතික ක්ෂුද්‍රශිලා මෙවලම් සකස්කරගැනීම සඳහා බහුල වශයෙන් කළුගල් භාවිතා කර ඇත.
   5. සතුන්ගේ අස්ථි කොටස් යොදාගනිමින් තියුණු උල් ආයුධ නිපදවාගෙන තිබේ. (.....)

24. තුන්වන විජයබාහු රජතුමා
   1. වන්නි නිරිඳු නමින් හැඳින්වේ.
   2. ජම්බුද්‍රෝණිය සිය පාලනය මධ්‍යස්ථානය බවට පත්කරගන්නා ලදී.
   3. කාලිංග මාඝ පරාජයට පත්කිරීම.
   4. බෙලිගල දළදා මැදුර ඉදිකිරීම.
   5. දඹදෙණිය විජේසුන්දරාරාමය කරවීම. (.....)

25. පෘතුගීසීන්ගේ ප්‍රාදේශීය පාලනය
   1. වෙළෙඳ හා ආගමික පරමාර්ථ මූලික කරගනිමින් පාලන කටයුතු මෙහෙයවීය.
   2. ප්‍රාදේශීය පාලනය සඳහා ලංකාව දිසාවෙනි පහකට බෙදා පැවතීම.
   3. යාපන ප්‍රදේශය කපිතාන් ජනරාල් විසින් පාලනය කරන ලදී.
   4. දිසාවෙනි කෝරළ වලටද කෝරළ පත්තුවලට බෙදා තිබීම.
   5. දේශීය බද්ද සංවිධානය සුළු සුළු වෙනස්කම් සහිතව ක්‍රියාත්මක කිරීම. (.....)

**26 - 30 දක්වා ප්‍රශ්නවලට A,B,C, හා D යන ප්‍රතිචාර අතරින්. එකක් හෝ කීපයක් හෝ නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාර**

Aහා B පමණක් නිවැරදි නම් අංක 1 ද B හා C පමණක් නිවැරදි නම් අංක 2 ද
C හා D පමණක් නිවැරදි නම් අංක 3 ද A හා C පමණක් නිවැරදි නම් අංක 4 ද
ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි ගණනක් නිවැරදි නම් අංක 5 ද අදාළ හිස්තැනෙහි ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | Aහා C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

26. සීතාවක රාජධානිය
   A) 1521 විජයබා කොල්ලයේ ප්‍රතිඵලයක් ලෙස සීතාවක රාජධානිය ආරම්භ විය.
   B) පෘතුගීසීන්ට හා කෝට්ටේ රාජ්‍යයට එරෙහිව සිදුවූ සටන්වලදී සැමෝරියන් අධිරාජයාගේ සහයෝගයහිමිවීම.
   C) රාජසිංහ රජුගෙන් පසුව සිහසුනට නිත්‍යානුකූල උරුමකරුවෙකු නොමැතිවිය.
   D) මායාදුන්නේ රජතුමා විසින් බැරැණ්ඩි කෝවිල ඉදිකරන ලදී. (.....)

27. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා,
   A) ශ්‍රී වික්‍රමසිංහ රාජසිංහ රජුගේ සහෝදරයාය.
   B) බුදු දහම වැළඳ ගැනීම.
   C) වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ පදවිය පිරිනැමීම.
   D) රජුට විරුද්ධව නිලම්ඹේ නුවර කැරැල්ලක් ඇතිවීම. (.....)

28. 1797 - 1798 බ්‍රිතාන්‍ය විරෝධී අරගලය
   A) බදු එකතු කිරීම සඳහා අවුමිල්දාර් නම් වූ විදේශිකයන් පිරිසක් පත්කිරීම.
   B) උඩරට ගිවිසුමේ වගන්ති කඩකිරීම.
   C) භාණ්ඩවලින් වෙනුවට මුදලින් බදු ගෙවීමට සිදුවීම.
   D) වෙල්ලස්සේ මුහන්දිරම් තනතුරට හජ්ජිමරික්කාර් පත්කිරීම. (.....)

29. කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ
   A) රජයේ පරිපාලන වියදම් අඩුකර ලාභය වැඩිකරගැනීම.
   B) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම.
   C) ශ්‍රී ලංකාව පළාත් හයකට බෙදා වෙන් කිරීම.
   D) උඩරට හා පහතරට ප්‍රදේශ වෙන් වෙන්ව පාලනය කිරීම. (.....)

30. ශ්‍රී ලංකාවේ වතු වගාව
   A) මුලින්ම වතු වගාව ලංකාවට හඳුන්වාදෙනු ලැබුවේ ඉංග්‍රීසීන් විසිනි.
   B) වතුවගාව නිසා සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය දියුණුවට පත්විය.
   C) හැමිලියා වෙස්ට්‍රාටික් නම් දිලීර රෝගය නිසා කෝපි වගාව විනාශයට පත්විය.
   D) වතු වගාව නිසා ප්‍රවාහන හා සන්නිවේදන ක්‍රමවල දියුණුවක් ඇතිවිය. (.....)

- අංක 31 සිට 35 තෙක් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා ඊට අදාළ අංකය තිත් ඉර මත ලියන්න.

31. ෆාහියන් හිමියන් මෙරටට පැමිණෙන අවධියේ මෙරට පාලකයා වූයේ කවුද?
 1. මුගලන් රජු 2. මහානාම රජු 3. මහසෙන් රජු
 4. හතරවන උදය රජු 5. භාතිකාභය රජු (.....)

32. ශ්‍රී ලංකාවේදී මුලින්ම පැවිදි දිවියට ඇතුළත් වූ පුද්ගලයා වනුයේ,
 1. අරිට්ඨ කුමරු 2. මහානාම කුමරු 3. මහල්ලක නාග
 4. භණ්ඩුක 5. සුමන සාමණේර (.....)

33. පෘතුගීසීන් විසින් ඕස්ත්‍රියාවේ කුමාරයා ලෙස හැඳින්වූයේ කවුරුන්ද?
 1. යමසිංහ බණ්ඩාර 2. විජේසුන්දර බණ්ඩාර 3. මානප්පෙරුම මොහොට්ටාල
 4. කොනප්පු බණ්ඩාර 5. ධර්මපාල කුමරු (.....)

34. උඩරට නිත්‍ය නේවාසික තනතුරට පත් පළමුවන තැනැත්තා කවුද?
 1. පෙඩ්රික් නෝත් 2. ජෝන් ඩොයිලි 3. තෝමස් මේට්ලන්ඩ්
 4. ඩග්ලස් විල්සන් 5. මේජර් ඩේවි (.....)

35. මල්වානේ රජු ලෙස හඳුන්වනු ලබන්නේ කවුරුන්ද?
 1. දොන් ජෙරනිමෝ ද අසවේදු 2. වීදිය බණ්ඩාර 3. සපුමල් බණ්ඩාර කුමරු
 4. පේරෝ ලෝපේස් ද සූසා 5. අම්බුළුගල කුමරු (.....)

- අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාළව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,2,3,4, සහ 5 යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ අංකය තිත් ඉර මත ලියන්න.

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදිය | වැරදිය |
| 2. | නිවැරදිය | නිවැරදිය |
| 3. | වැරදිය | වැරදිය |
| 4. | වැරදිය | නිවැරදිය |
| 5. | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදාදෙයි. |

| පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|
| 36. ලම්භකර්ණ රාජ වංශයේ ආරම්භක පාලකයා වසභ රජතුමාය. | වසභ රජතුමාගේ පාලනය යාපන ප්‍රදේශයේද විසිර පැතිර තිබූ බව පණකඩුව සන්නසෙන් තහවුරු වේ. (.....) |
| 37. කාවන්තිස්ස රජතුමා රෝහණය තුළ ඒකීය පාලනයක් ගොඩනැගූ පාලකයෙකි. | කාවන්තිස්ස රජතුමා ආක්‍රමණ විවාහ සබඳතා, හා ආගමික සබඳතා මගින් රෝහණය තුළ ඒකීය පාලනයක් ගොඩනැගීමට කටයුතු කරන ලදී. (.....) |
| 38. ද්විත්ව පාලනය යනු පෘතුගීසීන් හා ලන්දේසීන් ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශයේ පවත්වාගෙන ගිය පාලන ක්‍රමයයි. | 1796 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශය ඉංග්‍රීසීන් යටතට පත්විය. (.....) |
| 39. චෝළයින් ශ්‍රී ලංකාවේ තම පාලන ප්‍රදේශය මුම්මඩිචෝළ මණ්ඩලම් නමින් හඳුන්වන ලදී. | මහනුවර කේන්ද්‍ර කර ගනිමින් පළමුවරට ස්වාධීන පාලන මධ්‍යස්ථානයක් ගොඩනගන ලද්දේ සේනාසම්මත වික්‍රමබාහු විසිනි. (.....) |
| 40. පෘතුගීසීන්ගේ ලංකාගමනය සිදුවනවිට යාපනයේ පාලකයා වූයේ කනකසූරිය සිංගෙයි ආරියන්ය. | කුසුමාසන දේවිය දෝන මාගරිදා නමින් බෞතීස්ම ලැබීය. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

25 S II

දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Second Term Test - Grade 13 - 2018**

විභාග අංකය .............................   **ලංකා ඉතිහාසය II**   කාලය පැය දෙකයි

උපදෙස්

- පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් කැමති දෙකක් පිළිබඳව ඓතිහාසික කෙටි සටහන් ලියන්න.

(i) නාච්චදූව වැව  (ii) කප්පකන්දර නදී  (iii) මන්නාරම
(iv) සබරගමුව පළාත  (v) මල්වාන  (vi) පුලත්ථි නගර
(vii) ගාල්ල  (viii) බලන

(නිවැරදි ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි. ඓතිහාසික සටහනකට ලකුණු 5 බැගිනි)

02. ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම ලංකාවේ දේශපාලන ඉතිහාසය හැඩගැසීම කෙරෙහි සිදුකළ බලපෑම පිළිබඳ විමසුමක යෙදෙන්න. (ල. 14)

03. ශ්‍රී ලංකාවේ දේශපාලන එක්සත් භාවයක් ඇතිකළ පළමුවන පරාක්‍රමබාහු රජතුමා නිසැකවම මෙරට ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම පාලකයෙකි.

(i) පැරකුම් රජතුමා පිළිබඳ තොරතුරු අනාවරණය කරගත හැකි අභිලේඛණමය මූලාශ්‍රයක් නම් කරන්න. (ල. 1)
(ii) එතුමාගේ මව හා පියා නම් කරන්න. (ල. 2)
(iii) දක්ෂිණ දේශයේ පාලකයා ලෙස පැරකුම් රජතුමා විසින් සිදුකරන ලද ආර්ථික සංවර්ධනකටයුතු පිළිබඳ සමාලෝචනයක් කරන්න. (ල. 4)
(iv) පළමුවන පැරකුම් රජු ලංකාවේ දේශපාලන එක්සත් භාවයක් ඇතිකිරීමට ගත් ක්‍රියාමාර්ග ඇසුරෙන් ඉහත කියමන විචාරය කරන්න. (ල. 7)

04. ශ්‍රී ලංකාවේ ජලාශ්‍රිත ශිෂ්ටාචාරය හඳුන්වා එය පරිහාණියට හා බිඳවැටීමට බලපෑ සාධක පිළිබඳ විස්තර කරන්න. (ල. 14)

05. කෝට්ටේ යුගය ලංකා ඉතිහාසයේ ඉතා වැදගත් කාල පරිච්ඡේදයකි.

(i) ලංකාවට ගොඩබට පළමු යුරෝපීය ජාතිකයා කවුරුන්ද? (ල. 1)
(ii) ඔහු ලංකාවට පැමිණෙන විට කෝට්ටේ රාජධානියට අයත් ප්‍රාදේශීය පාලන මධ්‍යස්ථාන පහක් යටතේ පාලනය විය. ඉන් හතරක් නම් කරන්න. (ල. 2)
(iii) විජයබා කොල්ලය යනු කුමක්දැයි හඳුන්වා එහි ප්‍රතිඵල කෙටියෙන් විස්තර කරන්න. (ල. 4)
(iv) 'කෝට්ටේ රාජධානි සමයේ දී ලංකාව අවසාන වතාවට එක්සේසත් කරන ලදී.' යන ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න. (ල. 7)

06. දෙවන රාජසිංහ රජතුමා දේශීය විදේශීය වශයෙන් මුහුණදුන් අභියෝග හඳුන්වා ඔහු ඒවා ජයගැනීමට ගත් ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ල. 14)

07. මහනුවර රාජධානිය ඉංග්‍රීසීන් සමඟ පැවැත්වූ සබඳතා පිළිබඳ කෙටියෙන් විස්තර කර 1815 දී මහනුවර රාජධානිය ඉංග්‍රීසීන් යටතට පත්වීමට බලපෑ හේතු පහදන්න. (ල. 14)

08. එක්කෝ (A) කොටසට නැතහොත් (B) කොටසට පමණක් පිළිතුරු සපයන්න.

(A) 1833 දී හඳුන්වා දුන් කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ නිසා ශ්‍රී ලාංකික සමාජයේ සිදුවූ වෙනස්කම් පිළිබඳ විග්‍රහයක යෙදෙන්න.

(B) ශ්‍රී ලංකාවේ වතු වගාවේ ආරම්භය හා විකාශනය පිළිබඳ කෙටියෙන් හඳුන්වා එමගින් ඇතිවූ යහපත් හා අයහපත් ප්‍රතිඵල පිළිබඳ විස්තර කරන්න. (ල. 14)

09. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන ඒවායේ ඓතිහාසික වැදගත්කම පිළිබඳව විමසන්න.

(i) ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස පිහිටවීම.

(ii) දඹදෙණි යුගයේ සාහිත්‍යය


(iii) ගම්පොළ රාජධානිය හා අලගක්කෝණාර පරපුර

(iv) 1818 පළමු නිදහස් අරගලය.

(v) මිෂනාරී ව්‍යාපාරය

**12 / 13 ලංකා ඉතිහාසය** - 12 / 13 இலங்கை வரலாறு


විභාග අංකය
சுட்டெண்



**දෙවන වාර පරීක්ෂණය - 2018**
**ලංකා ඉතිහාසය - 13 ශ්‍රේණිය**
**පිළිතුරු - 1 කොටස**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 4 | 11. | 1 | 21. | 5 | 31. | 2 |
| 2. | 2 | 12. | 3 | 22. | 3 | 32. | 4 |
| 3. | 5 | 13. | 5 | 23. | 4 | 33. | 4 |
| 4. | 1 | 14. | 4 | 24. | 3 | 34. | 2 |
| 5. | 5 | 15. | 3 | 25. | 2 | 35. | 1 |
| 6. | 3 | 16. | 1 | 26. | 5 | 36. | 1 |
| 7. | 2 | 17. | 4 | 27. | 2 | 37. | 5 |
| 8. | 3 | 18. | 2 | 28. | 4 | 38. | 4 |
| 9. | 5 | 19. | 3 | 29. | 1 | 39. | 2 |
| 10. | 3 | 20. | | 30. | 3 | 40. | 3 |

**11 කොටස.**



01. කරුණු දක්වා ඇත ආකාරයට සුදුසු පරිදි පිළිතුරු ලබා දෙන්න.

02. ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම බාහිර භූගෝලීය පිහිටීම හා අභ්‍යන්තර භූගෝලීය පිහිටීම ලෙස දෙයාකාරවන බව.

**<u>බාහිර භූගෝලීය පිහිටීම :</u>** * ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටා තිබීම. * ඉන්දියාවට ආසන්නයේ පිහිටා තිබීම. * ඉන්දියාවෙන් වෙන්ව පිහිටා තිබීම.

**<u>අභ්‍යන්තර භූගෝලීය පිහිටීම :</u>** * වෙරළබඩතැන්න, * අඩතැන්න. * මධ්‍යම කඳුකරය. * වරාය. * ගංගා හා ගංගා නිම්න * දේශපාලනය සඳහා විදේශීය ආභාෂය ලැබීම. (ඉන්දියාව) මෞර්ය පාලනය, අභිෂේක ක්‍රමය, විරුදානාම * බුදු දහම දායාද වීම. - * දසරාජ ධර්ම, සතර සංග්‍රහ වස්තු වලින් බෞද්ධ පාලන සංකල්පය දේශපාලනයට එක්වීම. * භික්ෂූන් වහන්සේලා රාජ්‍ය අනුශාසකයන් බවට පත්වීම. * ශ්‍රී ලංකාවේ ආර්ය ජනාවාස පිහිටුවීම. * ගංගා හා ගංගා නිම්න ඇසුරුකරගෙන ආර්ථික ජනාවාස හා ශිෂ්ටාචාර ගොඩනැගීම.

* වරායන් ඇසුරෙන් විවිධ ආක්‍රමණ හා සංක්‍රමණ සිදුවීම. * ඉන්දියාවෙන් වෙන්ව පිහිටා තිබීම නිසා ස්වාධීන රාජ්‍යයක් බවට පත්වීම. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර හා බාහිර භූගෝලීය පිහිටීම ලංකාවේ දේශපාලනයට කළ බලපෑම විස්තර කර තිබිය යුතුයි.

03. (i) සංගමු විහාර ලිපිය, දෙවනගල ලිපිය, පොළොන්නරු කතිකාවත

(ii) මානාභරණ හා රත්නාවලී දේවිය

(iii)* පරාක්‍රම පුරය හෙවත් පඬුවස්නුවර දක්ෂිණ දේශයේ අගනගරය ලෙස සංවර්ධනය කිරීම.
* පඩාවැව හෙවත් බෑන සමුද්‍රය කරවීම. * වගුරුබිම් සරුසාර කුඹුරු බවට පත්කිරීම.
* දුදුරුඔය ස්ථාන දෙකකින් හරස්කොට දෝරදත්තික, කොට්ටබද්ධ, සූකර නිජ්ජර නමින් අමුණු තුනක් බැඳ වගාවට අවශ්‍ය ජලය සැපයීම.

(iv)* පැරකුම් රජු කුඩා අවධියේදී ලංකාව පාලන ප්‍රදේශ කිහිපයකට බෙදී පැවතීම.
- රජරට, දක්ෂි දේශය, අටදහස් රට, දොළොස්දහස් රට
* දක්ෂිණ දේශයේ බලයට පත්වූ පැරකුම් රජු රජරට ජයගැනීම සඳහා සටහන් මෙහෙයවීම.
* රජරට ජයගත් පසු මුහුණදුන් අභියෝග. * රුහුණ ජයගැනීම සඳහා සටන් මෙහෙයවීම.
* සේනාපතිවරුන්ගේ කැරළි (සූකරභාතුදේව) සාර්ථකව මර්ධනය කිරීම. * සුගලා සතු වූ දළදා වහන්සේගේ භාරකාරීත්වය ලබාගෙන සම්ප්‍රදායික රාජ්‍ය උරුමය තහවුරු කරගැනීම.

ආදී කරුණු ඔස්සේ විග්‍රහකර තිබීම වැදගත් වේ.

04. * ජලාශ්‍රිත ශිෂ්ටාචාරය යන්න හඳුන්වා තිබීම. * ඊට අනුරාධපුර පොළොන්නරු යුගයන් අයත්වන බව.
* එම ශිෂ්ටාචාරය පරිහානියට හා බිඳවැටීමට හේතු විස්තරකර තිබීම
- සතුරු ආක්‍රමණ, දුර්වල පාලකයින් බලයට පත්වීම නිසා මධ්‍යගත පාලනය බිඳ වැටීම, ආරක්ෂාව බිඳ වැටීම, රාජ්‍ය බලය ලබාගැනීම සඳහා මෞර්ය, ලම්භකර්ණ, කාලිංග - පාන්ඩ්‍ය රාජ වංශ අතර ඇති වූ බල අරගලය., භික්ෂූන් වහන්සේලා ජනතාව වෙනත් ප්‍රදේශකරා සංක්‍රමණය වීම, ආර්ථික පරිහානිය.

ආදී කරුණු ශිෂ්ටාචාරය බිඳවැටීමට බලපෑ අයුරු විවේචනාත්මකව විස්තර කළ යුතුය.

05. (i) ලොරෙන්සෝද අල්මේදා

(ii) කොළඹ (කෝට්ටේ), උඩුගම්පොළ, මැණික්කවර, රයිගම, මාදම්පේ.

(iii) හයවන විජයබාහු රජතුමාගේ පළමු අගබිසවගේ දරුවන් වූ මායාදුන්නේ, පරරාජසිංහ, රයිගම්බණ්ඩාර යන කුමාරවරුන් තම පියා මරා රාජ්‍ය පැහැර ගැනීම හා කෝට්ටේ රාජ්‍යයට අයත් ප්‍රදේශය කොටස් තුනකට බෙදා පාලනය කිරීම.

(iv)* කෝට්ටේ හයවන පැරකුම් රජුගේ අවධියේදී ලකාව අවසාන වතාවට එක්සේසත් කළ බව විස්තර කර තිබීම. පරාක්‍රමබාහු රජු කෝට්ටේ රාජ්‍යයට පත්වනවිට ලංකාව දේශපාලනමය වශයෙන් කොටස් වලට බෙදී පැවති බව විස්තර කිරීම. * යාපනය - කණකසූරිය සිංගෙයි ආරියන් විසින් පාලනය කරන ලදී. * වන්නි ප්‍රදේශ වන්නියාර්වරුන් විසින් පාලනය කිරීම. * උඩරට ජෝතිය සිටාණන් කැරළි ගැසීම. * උඩරට සේනාසම්මත වික්‍රමබාහු කැරළි ඇතිකිරීම.

යාපන ප්‍රදේශ හා වන්නි ප්‍රදේශය සපුමල්කුමරු විසින් අත්පත්කරගත් අයුරුද උඩරට ජෝතිය සිටාණන් ඇතිකළ කැරළි අම්බුළුගල කුමරුන් විසින්ද මර්ධනය කර ලංකාවේම බලය කෝට්ටේ vi පැරකුම් රජුහට හිමිවීම තුළින් ලංකාව එක්සේසත් කළ බව. නමුත් එතුමාගේ රාජ්‍ය කාලය අවසානයේදී මාතලේ ප්‍රදේශයෙන් පැනනැගි උඩරට කැරළි ගසා උඩරට ස්වාධීන පාලන මධ්‍යස්ථානයක් ගොඩනැගීම නිසා දේශපාලන එක්සත්භාවය බිඳීයාම. ඉන් අනතුරුව ලංකාවේ බලයට පත් කිසිදු පාලකයෙකුට ශ්‍රී ලංකාව එක්සේසත් කිරීමට නොහැකි වු බව විස්තර කිරිම වැදගත් වේ.

06. පෘතුගීසීන්ගෙන් හා ලන්දේසීන්ගෙන් එල්ල වූ අභියෝග (විදේශ අභියෝග)

* 1 රන්දෙනිවෙල සටන, 1 ගන්නෝරුව සටන. සටන් මෙහෙයවා මෙම ආක්‍රමණ මර්ධනය කිරීම.
* පෘතුගීසීන් පළවාහැරීම සඳහා ලන්දේසි සහයෝගය ලබාගැනීම. * ලන්දේසීන්ගේ සහයෝගයෙන් පෘතුගීසීන් ලංකාවෙන් පලවාහැරීම. * ලන්දේසීන් උපක්‍රමශීලීව තම බලය ගොඩනගා ගැනීමට උත්සාහ කිරීම.
* ලන්දේසීන්ගේ ක්‍රියාකාරකම් රාජසිංහ රජුට අභියෝගයක් වූ අයුරු විස්තර කිරීම. * ලන්දේසීන් ලංකාවෙන් පලවාහැරීම සඳහා ප්‍රංශ ජාතිකයන්ගේ සහය ලබාගැනීමට උත්සාහ දැරීම.

දේශීය අභියෝග

* අඹන්වෙල රාළගේ ප්‍රධානත්වයෙන් සිදුවූ නිල්ලඹේ කැරැල්ල ඇතිවීම. * අළුවිහාරේ නැමැත්තාගේ සහයෙන් කැරැල්ල මර්ධනය. මෙම අභියෝග හමුවේ රජු ක්‍රියාකළ අයුරු විස්තර කිරීම වැදගත් වේ.

07. ඉංග්‍රීසී ලංකාවට පැමිණෙන විට ශ්‍රී ලංකාවේ මුහුදු බඩ ප්‍රදේශ ලන්දේසීන් සතුවීම. * ඉංග්‍රීසීන් හා ලන්දේසීන් යුරෝපයේ මිතුරන් වූ බැවින් මුල්කාලවලදී දෙපිරිස අතර සටන් ඇතිනොවීම. * ඉංග්‍රීසීන් උඩරට රාජ්‍ය සමඟ සබඳතා ගොඩනගාගැනීමට විවිධ අවස්ථාවලදී උත්සාහ කළ අතර උඩරට පාලකයින් ලන්දේසීන් පලවා හැරීම සඳහා ඉංග්‍රීසීන්ගේ සහය ලබාගැනීමට උත්සාහ කරන ලදී. - 1762 ජෝන් පයිබස් කීර්ති ශ්‍රී රාජසිංහ රජු හමුවීම. - 1782 හියු බොයිඩ් රාජාධිරාජසිංහ රජු හමුවීම. - 1795 රොබට් ඇන්ඩෘස් රාජාධිරාජසිංහ රජු හමුවීම. - 1800 මැක්ඩෝවල් සෙනෙවි ශ්‍රී වික්‍රම රාජසිංහ රජු සමඟ ගිවිසුමක් ඇතිකරගැනීමට උත්සාහ දැරීම. - 1803 පෙඩ්රික් නෝත්ගේ උඩරට ආක්‍රමණය.

ලංකාවට පැමිණි ඉංග්‍රීසීන් මුල් කාලයේ ලංකාවේ විදේශ වෙළඳාම් කටයුතු වලට එක්වීමට උත්සාහ කළද පසුකාලීනව දේශපාලන බලය අත්පත් කරගැනීමට ද උත්සාහ දරා ඇති බව පෙනේ.

* 1796 දී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශයේ දේශපාලන බලය අත්පත් කරගැනීමත් සමඟ උඩරට දේශපාලන ආධිපත්‍ය ලබාගැනීමට උත්සාහ දරා ඇතිබව.

**1815 දී උඩරට ඉංග්‍රීසීන්ට යටත්වීමට හේතු**

* ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ ක්‍රියාකලාපය : - නායක්කර වංශිකයෙක් වීම, උඩරට රදළයින් නොසළකා හැරීම, රදළවරුන්ගේ බලය මර්ධනය කිරීමට උත්සාහ දැරීම, ඇහැලේපොළ දරු පවුල මරා දැමීම, මත්පැනට ලොල්වීම, ජන ප්‍රසාදය අහිමිකරගැනීම.
* ඇහැලේපොළගේ ක්‍රියාකලාපය : - ශ්‍රී වික්‍රම රාජසිංහ රජු නෙරපා සිංහල රජෙකු පත්කිරීමට කටයු කිරීම., ඉංග්‍රීසීන්ට සහය ලබාදීම.
* ඉංග්‍රීසීන්ගේ උපක්‍රමශීලී ක්‍රියා : - ජෝන් ඩොයිලි චරපුරුෂ සේවයේ යෙදවීම, රජු මත්පැනට හුරු කරවීම, රදළයින් අසමගි කිරීමට උත්සාහ කිරීම

ආදී කරුණු ඇතුළත් කර විවේචනාත්මකව කරුණු ඉදිරිපත් කිරීම වැදගත් වේ.

08. (A) කෝල්බෲක් නිර්දේශ මත ලාංකික සමාජයේ ඇතිකළ වෙනස විස්තර කළ යුතුය.

1. උඩරට පහතරට ඒකාබද්ධ පාලනයක් ගොඩනැගීම නිසා දේශීය පාලනය බිඳවැටීම.
2. උඩරට රාජ්‍යයේ සමාජක්‍රමයේ පදනම වූ රාජකාරි ක්‍රමය අහෝසි කිරීම.
3. වතු වගාවට අවශ්‍ය පසුබිම සකස්කිරීම නිසා සාම්ප්‍රදායික කෘෂිකර්මය බිඳවැටීම.
4. ලංකාව පළාත් පහකට බෙදීම නිසා පරිපාලනය බිඳ වැටීම.
5. ජනතා ගැටළු විසඳීමට තිබූ ගම්සභා ක්‍රමය අහෝසි කර උසාවි අධිකරණ ක්‍රමය හඳුන්වා දුන් නිසා ජනතාව අපහසුතාවයට පත්වීම.
6. වතු වගාව නිසා උඩරට ජනජීවිතය සංකර බවට පත්වීම.
7. උඩරට ප්‍රදේශ පුරා මත් උවදුර පැතිරයාම.

(B) * ලන්දේසීන් විසින් ලංකාවට වතු වගාව හඳුන්වා දීම. * ඉංග්‍රීසීන් ලංකාව තුළ මහා පරිමාණ වතුවගාව ආරම්භය . * ඉංග්‍රීසීන් යටතේ කෝපි වගාව දියුණුවට පත් වීම. * කෝල්බෲක් නිර්දේශ වතු වගාවේ දියුණුවට හේතු වීම. * කෝපි වගාවේ පරිහානියත් සමග සිංකෝනා, කොකෝවා වැනි භෝග වගා කළ අතර පසුව තේ, පොල්, රබර් වගාවන් දියුණුවට පත්විය.

යහපත් : * වතුවගාවේ දියුණුවත් සමඟ ප්‍රවාහන, සන්නිවේදන වැනි යටිතල පහසුකම් දියුණුවට පත්විය. රට පුරා දුම්රිය හා මහාමාර්ග ඉදිවීම. * ආර්ථික සංවර්ධනය. * බැංකු හා රක්ෂණ ක්‍රම දියුණු වීම. * තැපැල් සේවය ආරම්භ වීම.

අයහපත් : * යැපුම් කෘෂිකාර්මාන්තය පරිහානිය. * මාර්මාර්ග පද්ධතිය බිඳවැටීම. * දකුණු ඉන්දීය කම්කරුවන් නිසා සමාජය විපරීත වීම. * ඉඩම් අහිමි පිරිස් ඇතිවීම. * නාගරීකරණය නිසා සෞඛ්‍ය ගැටලු ඇතිවීම.

09. (i) * ලංකාවට විවිධ කාලවලදී සංක්‍රමණ වූ ආර්ය කණ්ඩායම්. * ඔවුන් පිහිටුවාගත් ජනාවාස. * ආර්ය සංක්‍රමණය නිසා ඇතිව ආර්ථික, දේශපාලන, සංස්කෘතික වෙනස්වීම්. * ඔවුන් ජනාවාස තෝරාගැනීමේදී අවධානය යොමුකළ කරුණු.

(ii) * දඹදෙණියේ III විජයබාහු හා II පැරකුම් රජුගේ අනුග්‍රහය. * අධ්‍යාපනය සඳහා රාජ්‍ය අනුග්‍රහ ලැබීම නිසා උගතුන් රැසක් බිහිවීම. * ඔවුන් පොතපත රචනා කිරීම. * විදේශ බලපෑම් නිසා රට හැරගිය උගතුන් ගෙන්වා පොතපත ලියවීම. * රජවරුන් පවා පොතපත ලිවීම. (II පැරකුම් රජු) * මෙම යුගයේ පැවති අධ්‍යාපන ආයතන උගතුන් හා ලියන ලද පොතපත පිළිබඳ විස්තර කිරීම.

(iii) <u>ගම්පොළ රාජධානිය හා අලගක්කෝණාර පරපුර</u>
* ආරම්භය නිශ්චිත නැත. * කෝරළයේ වංචිපුර සිට පැවත එන බව විශ්වාස කෙරේ. * ඉබන් බතූතා ලංකාවට එනවිට එම පරපුරේ 9 වැනි අලගක්කෝණාර රයිගම පාලකයා විය (අල්කෝර්) * III විජයබාහුගේ අග්‍රමන්ත්‍රී රජා ලංකා මහීතලේ ප්‍රභුරාජ නිශ්ශංක අලගක්කෝණාර එම පරපුරේ 10 වෙනියා විය. * අලගක්කෝණාර පරපුරේ පද්වතී දේවියගේ පුත් අලගක්කෝණාර (II) හෙවත් වීර අලකේශ්වර පස්වන බුවනෙකබාහුගේ අගමැති ලෙස පත්වීම. * පද්මාවතීගේ පුත් දේව මන්ත්‍රී කුමරු V බුවනෙකබාහුගෙන් පසුව ගම්පොළ රජවීම. * වීර අලකේශ්වර රයිගම බලය ගොඩනැගීම. * චීන ආක්‍රමණ නිසා අලකේශ්වර බලය බිඳ වැටීම.

(iv) <u>නිදහස් අරගලයට බලපෑ හේතු :</u> * උඩරට ගිවිසුම කඩවීම. * රදළවරුන්ගේ වරප්‍රසාද අහිමිවීම. * රජෙකු නැතිවීම නිසා ඇති වූ කණගාටුව. *වෙල්ලස්සේ මුහන්දිරම් තනතුරට හජ්ජි මරික්කාර් පත්කිරීම. * ඌව වෙල්ලස්ස ප්‍රදේශයෙන් රාජ්‍ය උරුම කරුවෙකු පැන නැගීම.
<u>සටනේ නායකයින් :</u> * මොණරවිල කැප්පිටිපොළ දිසාව - දඹවින්න දිසාව, මඩුගල්ලේ දිසාව - කිවුලේගෙදර මොහොට්ටාල. * බූටෑවේ රටේ රාළ. * කොහුකුඹුරේ රටේ රාළ, දිඹුලාන දිසාව
<u>සටන මර්ධනය කිරීම :</u> * ඉංග්‍රීසීන් විසින් බිම්පාළු ප්‍රතිපත්තියක් අනුගමනය කර යුධනීතිය පැනවීම.
<u>අසාර්ථක වීමට හේතු :</u> * සටන මැනවින් සංවිධානය වී නොතිබීම. * නායකයින් අතර පෞද්ගලික මතභේද ඇතිවීම. * මොල්ලිගොඩ අධිකාරම් තුමා හා එක්නැලිගොඩ ඉංග්‍රීසීන්ට සහාය ලබාදීම. * දළදා වහන්සේගේ භාරකාරීත්වය ඉංග්‍රීසීන් සතුවීම. * නව රජුට රාජ්‍ය උරුමයක් නොමැතිබව හෙළිවීම.
<u>මිෂනාරී ව්‍යාපාරය :</u> * පෘතුගීසීන්, ලන්දේසීන් හා ඉංග්‍රීසීන් කිතුණු දහම ප්‍රචාරය කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ග මිෂනාරී ව්‍යාපාරය ලෙස සැලකේ.
**අනුගමනය කළ ක්‍රියාමාර්ග** : රාජ්‍ය අනුග්‍රහය ලබාගැනීම, මිෂනාරී කණ්ඩායම් තරඟකාරීව කටයුතු කිරීම., සමාජසේවා කටයුතුවල නිරත වීම, පොත්පත් පත්‍රිකා මුද්‍රණය කර නොමිලයේ බෙදාහැරීම, කිතුනු පොත්පත් සිංහල හා දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම, අධ්‍යාපනය යොදාගැනීම, අන්‍ය ආගම් විවේචනය කිරීම.